# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 44 - 2020 දෙසැම්බර්




## “දූරියන් ශාකයේ” දකින කෘමි හානි කීපයක්



නිවැරදි ආකාරයට භූමිය තෝරාගෙන නිසි වයසේ බද්ධ දූරියන් පැළයක්, ක්‍රමානුකූලව භූමියේ සිටුවනවා මෙන්ම ළපටි අවස්ථාවේදී සිටම පැලයට වැළඳිය හැකි රෝග පිළිබඳවත්, සිදුවිය හැකි කෘමි අසාදනයන් ගැනත් අවධානයෙන් සිටිය යුතුවේ. ඇතැම් විට බාල අවධියේදීම රෝග හා පළිබෝධකයින් හේතුවෙන් පැළය මැරී යා හැකිය. එසේ නැතහොත් වැළඳෙන රෝගයක් යම් තරමකින් ශාකය තුළ සැඟවී සිටිමින් හා අභ්‍යන්තරයේ පැතිරෙමින් සුවකළ නොහැකි ආසාදනයක් ශාකයට උරුමකර දිය හැකිය. මෙම තත්වය උදාවන්නේ ඵලදාව ලැබෙන කාලයට දූරියන් ගස ගැන සැළකිලිමත්ව සිටියත් වසරේ වැඩි කාලයක් තිස්සේ ශාකය මතකයෙන් ඈත් කිරීමට වගාකරුවන් පුරුදු වී ඇති බැවිනි.

පත්‍රිකා අංක 43 යටතේ රෝග පිළිබඳව විස්තරාත්මකව සඳහන් කළ බැවින් දැන් අවධානය යොමු කරන්නේ කෘමි හානි පිළිබඳවයි. ළපටි පැළ අවධියේ සිටම හඳුනාහත හැකි කෘමි හානියකි කොරපොතු කෘමියාගේ හානිය. මෙම සත්වයා බැලූ බැල්මටම නොපෙනෙන්නේ කුඩා බව නිසාත්, දූරියන් පත්‍රවල ලා දුඹුරු පැහැති යටි පැත්තට උගේ දේහ වර්ණය හොඳින් ගැලපීමත් නිසාය.එසේ නමුත් පත්‍රයෙන් යුෂ උරාබීම නිසා සිදුවන හානිය උඩු පැත්තෙන්ද පෙනේ. කොළ පැහැ උඩු පැත්තේ හටගන්නා කහපාට තිත් වලිනුයි මෙම හානිය නිරූපණය වන්නේ. එවන් අවස්ථාවක් දකින්නේ නම්, පත්‍ර යටිපැත්ත තියපිටින් සීරීමෙන් කොරපොතු කෘමියන් පත්‍ර පෘෂ්ඨයෙන් ගලවා ගෙන පළිබෝධ පැවැත්ම සනාථ කරගත හැකිවේ. අනවධානයෙන් සිටියහොත් සතුන් වැඩි වැඩියෙන් බෝවී පත්‍ර යුෂ උරාබීම නිසා ළපටි පැළය මියයාමට වුවත් හැකි නිසා නිර්දේශිත ප්‍රමාණයකින් කෘමිනාශකයක් යොදා පාලනය කිරීම අත්‍යවශ්‍යය. ඉමිඩොක්ලොප්‍රිඩ් (Imidocloprid) වර්ගයක් මේ සඳහා සුදුසුය.

තවත් බරපතල හානි ගෙනදෙන කුරුමිණියෙක්ද සිටී. බැක්ටොසෙරා රූෆොමැකියුලේටා *(Bactocera rufomaculata)* නමැති මේ කුරුමිණියා ගසේ පොත්තේ තිබෙන පැලුම් තුළ බිත්තර දමන්නේය. පුපුරා එන්නේ සිහින් කෙස් ගසක් වැනි කීටයින් වුවත් මාස 10 ක් පමණ දිගු කාලයක් ඌ ගස තුළ වැඩේ. අවසානයේ ඇඟිල්ලක් තරමට මහත්වේ. මෙතරම් දිගු කාලයක් ගස තුළ ජීවත්වෙමින් මෙම කීටයා සිදුකරන්නේ මහත් හානියකි. පොත්ත හා ලීය අතරින් උමං සාදමින් තමාට ඉදිරියෙන් ඇති පටක කා දමමින් ඌ සැරිසරයි. ඒ නිසා ඉහළ සිට පහළ මුල් පද්ධතිය කරා සිදුවෙන ද්‍රව්‍ය පරිවහනයට බාධා පැමිණී ගස ටිකෙන් ටික අඩපන වන්නේය. දිනපතා නොව සතියකට දෙකකට වරක්වත් දූරියන් ගස හා අවට පරිසරය පරීක්ෂා කරන්නේ නම් මෙම “පනුවා”





ගේ හානිය දැකගැනීමට අපහසු නැත. පොත්තේ ඇති සිදුරකින් "පණු පස්" වැනි දෙයක් ගස මුලට හැලී ඇත්නම් සිදුර තුල වැඩුණු පණුවෙක් සිටින බවට හොඳ සාක්ෂියකි. සාමාන්‍යයෙන් එක ගසක සිටින්නේ වැඩුණු පනුවන් එකෙක් දෙදෙනෙක් වැනි සුළු ගණනකි. ඒ නිසා පනුවා ඉවත්කිරීමට උපදෙස් දීම ප්‍රායෝගික විසඳුමකි. සිදුර තරමක් පාදාගතහොත් එය අපහසු නොවේ. අනතුරුව ඉමිඩොක්ලොප්‍රිඩ් (Imidocloprid) වර්ගයක් සමග කණ්ඩසාන් නමැති

(a) (b)



දිලීර නාශකය (මෙය රබර් කිරිකැපීමේදී පොත්තට සිදුවෙන තුවාල සඳහා කරන ආලේපයයි) මැටි ස්වල්පයක් සමඟ එකට අනා ආලේප කිරීමෙන් සිදුර හා තුවාලය වසා දැමිය හැකිය. සාමාන්‍යයෙන් මෙවැනි පනුවන් වැඩිපුර සිටින්නේ ගසෙහි පාදීය ප්‍රදේශය අසල බැවින් අවධානයෙන් සිටියහොත් පනුවා ඉවත්කර ශාකය බේරාගැනීම අපහසු නොවේ. ශාකයේ ඉහළ ප්‍රදේශයේ වුවත් මේ අසාදනය සිදුවිය හැකිබව අමතක කරන්න එපා.

**"තවත් ඉන්නවා හාල් ගුල්ලෙක් වගේ පොඩි සතෙක්. ප්ලැටිපස් (Platypus) හෝ සයිලොබෝනස් (Xylobonus) කියන ගණ වලට අයත් සතුන් තමයි මේ අය. ශාකය දුර්වල වෙනකොට මේ සතුන් වුවත් එනවා. සමූහ වශයෙන් ඇවිත් පෙනේරයක් වගේ වෙන්න පොත්ත විදිනවා. මේ අයගේ "පනුපස්" වැටෙන්නේ නූඩ්ල්ස් රැල් වගේ. ඒකෙන් හඳුනාගන්න පහසුයි ගස ඇතුළත ඔවුන් සිටින බව"**

දූරියන් වගාකිරීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් වූ තාක්ෂණික තොරතුරු සැපයූ හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ප්‍රධාන පළතුරු අභිජනන විද්‍යාඥ ඩබ්ලිව්. ඩී. ලෙස්ලි මහතා කෘමි හානි වල ස්වභාවය ගැනද කරුණු දක්වමින් එසේ පවසා සිටී. එහිදීද ප්‍රතිකාරය වන්නේ රසායනික මර්දනයමය.

**"ගස ශක්තිමත් නම් මේ උවදුරු බොහෝදුරට මග හරින්න පුළුවන්. මේ සතුන් දුර්වල ශාක සොයාගෙනමයි එන්නේ. ගෙඩි සෑදෙන කාලයට දූරියන් ගසට ළංවෙලා තමන්ගේ වැඩේ කරගත්තට පස්සේ ශාකය අතහැර දමන සිරිත නිසා තමයි අද තිබෙන පැරණි ගස් බොහොමයක් ලෙඩ වෙලා තියෙන්නේ. ගස මුල උදලු ගෑම අපි නිර්දේශ කරන්නේ නෑ මතුපිට මුල් කැපෙන නිසා. නමුත් ගහ මුල පිරිසිදු කරලා කාබනික පොහොර යහමින් දාලා ශාකයට සැළකුවහොත් කෘමි උවදුරු හා වෙනත් රෝග වලට එරෙහි ස්වභාවික ප්‍රතිශක්තියක් ශාකයට ලැබෙනවා. ප්‍රශ්නය ඒ ක්‍රමයට කළමනාකරණය කරගන්නවානම් තමයි තිරසාර විසඳුමක් ලැබෙන්නේ"**

ප්‍රතිශක්තිකරණය ඉහළ නංවාගැනීම වැනි මේ දිනවල නිතරම කතාකරන මාතෘකාවකින්ම ලෙස්ලි මහතා සංවාදය නිමාකර සිටී. පැළයක් සිටුවීමට බොහෝදෙනා තුළ තිබෙන උනන්දුව එය වෘක්ෂයක් බවට පත්වෙනතුරු රැකබලාගැනීමටත් ඇත්නම්, නිසි පෝෂණයක් වැඩෙන ශාකයට ලබාදෙන්නේ නම්, රෝග හා පළිබෝධකයින් දූරියන් වගාව තුළ එතරම් ප්‍රශ්නයක් ඇති නොකරන බව කියවෙන මේ තොරතුරු, වෘක්ෂ වගාවක් අරඹන කා හට වුවත් වැදගත් පණිවිඩයක් වේ.

**පිටපත : සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව**

**තාක්ෂණික කරුණු : ඩබ්.ඩී. ලෙස්ලි, ප්‍රධාන විද්‍යාඥ (පලතුරු අභිජනන) පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ**

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : ඩබ් .එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)